**සීමාසහිත ලංකා වානේ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය හේතුවෙන් මිලේනියම් සිටි නිවැසියන්ට සිදුවන අපහසුතා පිළිබඳ විශේෂ විගණනය - 2015**

## 1. පසුබිම හා වර්තමාන තත්ත්වය

### 1.1 වානේ කර්මාන්ත ශාලාව

1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථාපනය කිරීමේ පනත යටතේ චීන සමූහාණ්ඩුවෙන් ලංකා රජයට ලැබූ පරිත්‍යාගයක් ලෙස මෙම කර්මාන්ත ශාලාව ආරම්භ කර ඇත.

දේශීය වශයෙන් අවශ්‍ය යකඩ හා වානේ මෙම කර්මාන්ත ශාලාව මගින් නිපදවා ඇති අතර පසු කාලීනව රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල යටතේ අලාභ ලබමින් තිබූ ආයතනයක් වශයෙන් මෙම ආයතනයද 1996 වර්ෂයේ දී පෞද්ගලීකරණය කර ඇත. ඉන් අනතුරුවද එහි පෞද්ගලික අයිතිය අවස්ථා කීපයකදී වෙනස්වීමට ලක්ව වර්තමානයේදී දේශිය ආයෝජකයෙක් විසින් පෞද්ගලික සමාගමක් ලෙස එය පවත්වාගෙන යනු ලැබේ.

ආරම්භයේදී අගනුවරට නුදුරුව එහෙත් එවකට ජනාවාස නොවූ අක්කර 182 ක් පමණ වූ භූමි භාගයක් මෙම කර්මාන්ත ශාලාවට අයත්ව තිබූ අතර කර්මාන්ත ශාලා භූමියේ මායිමේ සිට රක්ෂිතයක් ලෙස කිලෝමීටර 1ක පමණ තීරුවක් වෙන් කර තිබුණි. තවද කර්මාන්තශාලා භූමිය තුළ පරිසර හිතකාමී බව ආරක්ෂා කිරීමට විවිධ රුක් රෝපණයන් සිදු කර තිබූ අතර ඇතුලත ඉදිකර තිබූ ජලාශය මගින් පාරිසරික සමතුලිතභාවය තවදුරටත් වැඩිකර තිබුණි. ඊට සමගාමීව කර්මාන්ත ශාලාව අවට වූ රක්ෂිත ප්‍රදේශය මගින් කර්මාන්ත ශාලාවෙන් බාහිර පරිසරයට එල්ල විය හැකි බළපෑම තවදුරටත් අවම වී තිබුණි.

වර්තමාන හිමිකාරිත්වය යටතේ ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘතියක් ලෙස 2011 වර්ෂයේ මැයි 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම කර්මාන්තය නවීන තාක්ෂණයෙන් යුත් කර්මාන්ත ශාලාවක් ලෙස නවීකරණය කර නිෂ්පාදන කටයුතු සිදු කිරීම 2012 වර්ෂයේදී ආරම්භ කර ඇත.

#### 1.1.1 වානේ කම්හලේ අයිතිය වෙනස් වීමත් සමඟ කර්මාන්ත ශාලාවේ සිදු වූ වෙනස්කම්

1961 වර්ෂයේ ආරම්භකල මෙම වානේ කම්හල රාජ්‍ය සංස්ථාවක් ලෙස ද, අනතුරුව 1993 වර්ෂයේ රජයට අයත් පෞද්ගලික සමාගමක් ලෙස ද පවත්වාගෙන ගොස් පසුව 1996 වර්ෂයේදී කොරියා හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් ආයතනයට විකුණා ඇත. ඉන් අනතුරුව මෙම කර්මාන්ත ශාලාවේ අයිතිය වෙනත් පෞද්ගලික ආයතනයක් වෙත පවරා තිබුණි.

දිගින් දිගටම අයිතිය වෙනස්වීම් වලට ලක් වෙමින් 2010 වර්ෂයේදී වර්තමාන හිමිකාරිත්වය විසින් "සීමාසහිත ලංකා වානේ සංස්ථාව" නමින් සංස්ථාපනය කර නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇත. එහිදි මෙම කර්මාන්තය විවිධ වෙනස්කම් වලට භාජනය කර අවසානයේදී වානේ කම්බි නිපදවීමට අමතරව ගැල්වනයිස් බට නිෂ්පාදනය දක්වා වර්ධනය වී තිබුණි. එහිදී නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන ක්‍රම වෙනස් කර තිබූ අතර විශේෂයෙන් විදුලියට අමතරව ගල් අඟුරු, ඇව්තෙල් යන ශක්ති ප්‍රභවයන් උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම නිසා යම් ප්‍රමාණයකට ඉන් පිටවන දුම වැඩිවීමක් සිදු වී ඇත. මෙම විවිධ වැඩි දියුණු කිරීම් මගින් කර්මාන්ත ශාලාවේ ධාරිතාවය වැඩිකර ගැනීමට හැකියාව ලැබි තිබූ අතර එමගින් රටේ දේශීය වානේ කම්බි හා පයිප්ප නිෂ්පාදනය වැඩිකර ගැනීමට දායකත්වයක් ලබා දී තිබුණි.

### 1.1.2 කර්මාන්ත ව්‍යාපෘතිය අනුමත කිරීම

නවීන තාක්ෂණයෙන් යුතු කර්මාන්ත ශාලාවක් ලෙස මෙම කර්මාන්තශාලාව තුළ ගැල්වනයිස් බට කර්මාන්තය ආරම්භ කිරීමට 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ අනුමත කිරීමෙන් පසුව ආයෝජන මණ්ඩලයේ අනුමැතිය යටතේ කටයුතු කර ඇති අතර මෙවැනි කර්මාන්තශාලා පවත්වාගෙන යාම වෙනුවෙන් ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය පරිසර අධිකාරිය මඟින් 2013 නොවැම්බර් 20 සිට 2014 නොවැම්බර් 19 දක්වා කාල සීමාව සඳහා නිකුත් කර තිබුණි. එසේ වුවද ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් වෙනුවෙන් ආයෝජන මණ්ඩලය විසින් නිකුත් කල යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීම සම්බන්ධයෙන් වර්තමාන කර්මාන්ත ශාලාව තුල සිදුකල යුතු කාර්යයන් සඳහන් කර ඒවා නිවැරදි කිරීමට දන්වා තිබුණද එහි සඳහන් ඇතැම් කාර්යයන් නිවැරදි කර නොතිබූ අතර ආයෝජන මණ්ඩලයේ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමද දිගින් දිගටම ප්‍රමාදවී පැවතුණි.

## 1.2 මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත තවත් ව්‍යාපෘතියක් ලෙස මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතිය 1999 වර්ෂයේදී ආරම්භ කර ඇත. මෙම නිවාස ව්‍යාපෘතියෙන් අක්කර 97.3 ක් තුළ නිවාස 1575ක් ඉදිකිරීමට මූලිකව සැලසුම් කර තිබූ අතර එය කලාප 06කින් යුක්ත විය. මෙම ව්‍යාපෘතිය අතුරුගිරිය වානේ කම්හල වටා පිහිටි රක්ෂිත ප්‍රදේශයද ඇතුළත්ව ව්‍යාප්තව පවතී. තවද මෙම නිවාස ව්‍යාපෘතියේ නිවාස වර්ග A, B, C වශයෙන් වර්ග 3කින් සමන්විතව ඇති අතර ඒවා තනි තට්ටුව, තට්ටු දෙක වශයෙන් මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රමයක් ලෙස නිර්මාණය කර තිබුණි. වානේ කම්හල සීමා මායිම් ආසන්නයේ ඉදිකර තිබූ නිවාස වල සැලසුම තනි තට්ටුවකට සීමා කර තිබූ අතර එය කර්මාන්ත ශාලාවේ බලපෑම අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයක් බවට නිශ්චය කල හැකි විය. මෙම තත්ත්වය යටතේ ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘතියක් ලෙස නිවාස හා නාගරික සංවර්ධන අධිකාරිය හා අදාල පළාත් පාලන ආයතන බල ප්‍රදේශය වන එවකට කඩුවෙල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ මෙහි ඉදිකිරීම් ආරම්භ කර ඇත.

### 1.2.1 මිලේනියම්සිටි නිවාස ව්‍යාපෘතිය අනුමත කිරීම

මේ සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි විය.

(අ) කර්මාන්ත ශාලාවේ රක්ෂිත ඉඩමද ඇතුළුව එයට ආසන්නව ආරම්භකර තිබූ මෙම නිවාස ව්‍යාපෘතිය පිළිබඳ මූලික අධ්‍යනයන් වලදී පාරිසරික බලපෑමක් ඇතිවිය හැකි තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් සැලකිල්ලක් යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම කර්මාන්ත ශාලාව මුලින්ම ආරම්භ කිරීමේදී එවැනි කර්මාන්තයකට අත්‍යවශ්‍යයෙන්ම ඇති කළ යුතු රක්ෂිත ප්‍රදේශයක අවශ්‍යතාවය හඳුනාගෙන ඊට අවශ්‍ය ඉඩකඩ වෙන් කර තිබූ නමුත් මෙම නිවාස ව්‍යාපෘතිය අනුමත කිරීමේදී කර්මාන්ත ශාලාව සඳහා එවැනි රක්ෂිත ප්‍රදේශයක අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් එවකට ලංකා වානේ සංස්ථාවට අයත් වූ එම රක්ෂිත ප්‍රදේශයේ අක්කර 97.3ක ඉඩම් ප්‍රමාණයද පවරාගෙන කර්මාන්ත ශාලාවේ සීමා මායිම් ආසන්නයේ සිට අදාල නිවාස ඉදිකිරීමට කටයුතු සිදු කර තිබුණි. මෙහිදී කර්මාන්ත ශාලාවේ සීමාව ආසන්නයේ ඉදිකරනු ලබන නිවාස (පරිසර වාර්තාවෙන් අනුමත කල පරිදි) තනි තට්ටුවේ නිවාස විය යුතු බවට නිගමනය කොට ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

එසේ වුවද 1998 ඔක්තෝබර් 28 දින මෙම නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධව පවත්වන ලද නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නිරීක්ෂණ වැඩ කමිටු වාර්තාවේ '2' ඡේදය අනුව සීමාසහිත ලංකා වානේ සංස්ථාවේ අනාගත වැඩිදියුණු කිරීම් වලදී මෙම නිවාස ව්‍යාපෘතිය ගැටළුවක් විය හැකි බවට නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි.

කරුණු එසේ තිබියදී මෙම ව්‍යාපෘතියේ මූලික පරිසර වාර්තාව (IEE) සඳහා සම්පූර්ණ අනුමැතිය නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලබාදී තිබුණි. එසේ වුවද කර්මාන්ත ශාලාවේ බලපෑම වැඩි වශයෙන් ඇති කලාප අංක 5 කොටසේ නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය හා නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යන ආයතන විසින් අනාගතයේදී මෙම කර්මාන්ත ශාලාවේ සිදුවිය හැකි පුළුල් කිරීම් හෝ සංවර්ධන කටයුතු නිසා මෙම ව්‍යාපෘතියෙන් කර්මාන්ත ශාලාවට ආසන්න කලාපවල පදිංචිකරුවන්ට ඇති විය හැකි බලපෑම පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

## 2. විගණනයේ පදනම

එවකට ලංකා වානේ සංස්ථාව නමින් බැර කර්මාන්තයක් ලෙස ආරම්භකිරීමේදී ඊට අදාල පාරිසරික බලපෑම අවම කිරීමට විවිධ ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණි. එහෙත් 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ මිලේනියම්සිටි නිවාස ව්‍යාපෘතියට අයත් නිවාස මෙම කර්මාන්ත ශාලාව ආසන්නයේ වූ රක්ෂිත කොටසේ ඉදිකිරීම හේතුවෙන් නිවාස යෝජනා ක්‍රමයේ කළාප අංක 05 ට අයත් නිවාස වල නිවැසියන්ගෙන් විටින් විට මෙම කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් විවිධ පැමිණිලි ලැබෙන්නට පටන්ගෙන ඇත. මූලික වශයෙන් අධික ශබ්දය හා දුම හේතු කොටගෙන මෙම නිවැසියන්ගේ ජන ජීවිතයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව එම පැමිණිලි වල අන්තර්ගතව තිබුණි. ඒ අනුව මෙවැනි ගැටලුවකදී මූලිකව ක්‍රියාකළ යුතු ආයතනය වශයෙන් මෙම ව්‍යාපෘති අනුමත කිරීම හා දැනට පාලනය කරනු ලබන ආයෝජන මණ්ඩලය, පාරිසරික ගැටළු සම්බන්ධයෙන් මැදිහත් විය යුතු මධ්‍යම පරිසර අධිකාරිය හා අදාල නිවාස ව්‍යාපෘතිය පිහිටා තිබෙන කඩුවෙල නගර සභාව යන ආයතන කිහිපයෙහිම කටයුතු හා වගකීම සැළකිල්ලට ගෙන මෙම නිවාස යෝජනා ක්‍රමයේ නිවැසියන්ට හා පරිසරයට බලපාන ගැටළු සම්බන්ධයෙන් මෙම ආයතන විසින් කටයුතු කර ඇති ආකාරය විගණනයට ලක් විය.

## 3. නිරීක්ෂණ

### 3.1 නව ගැල්වනයිස් නිෂ්පාදන අංශය ආරම්භ කිරීම

2008 අංක 14 දරණ ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇතිව නව ගැල්වනයිස් බට නිෂ්පාදන අංශය ආරම්භ කිරීමත් සමඟ ඊට නිවාස යෝජනා ක්‍රමයේ නිවැසියන්ගේ විරෝධතා මතු වී ඇත. එම විරෝධයට හේතුවී තිබුණේ කර්මාන්ත ශාලාවෙන් දිවා හා රාත්‍රි කාලයේ අධික ශබ්දයක් ඇතිවන බවත් මෙම නිෂ්පාදන අංශය මඟින් නිකුත් කෙරෙන දුම හා අධික ශබ්දය එම වැසියන්ගේ ජන ජීවිතයට බාධාවක්වීමත්ය.

ඒ අනුව කර්මාන්තයෙන් දිවා හා රාත්‍රී කාලයේ ඇති වන අධික ශබ්දය පාලනය සඳහා ආයෝජන මණ්ඩලය හා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් උපදෙස් හා මඟ පෙන්වීම ලබා දී තිබුණි.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

### 3.2 කර්මාන්ත ශාලාවේ කටයුතු සම්බන්ධව සිදුකෙරුණු පරීක්ෂණ

කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ජනනය වන ශබ්දයේ මට්ටම පිළිබඳ කර්මාන්ත ශාලාවේ හා පැමිණිලි පාර්ශවයේ ගෘහයන් ආශ්‍රිතව දිවා හා රාත්‍රි කාලයේ දී අපගේ කාර්යය මණ්ඩලය හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්ද සමඟ නිරීක්ෂණයන් දින 04ක් තුළ සිදු කෙරුණි. එහිදි කර්මාන්ත ශාලා භූමිය මෙන්ම, කර්මාන්ත ශාලාවේ බලපෑම එල්ල වී ඇති නිවාස යෝජනා ක්‍රමයේ අදාල කලාපයද පරීක්ෂාවට ලක්විය. එම පරීක්ෂණයෙන් අනාවරණය වූ තොරතුරු පහත පරිදි විය.

(අ) 2015 ජුලි 13 දින දිවා කාලයේදී අප විසින් කර්මාන්ත පරිශ්‍රය නිරීක්ෂණයට ලක් කළ අතර එහිදී අනාවරණය වූ පරිදි අවට නිවැසියන්ට සිදුවන අපහසුතා අවම කිරීම සඳහා කර්මාන්ත ශාලාවේ කළමනාකාරීත්වය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

i. ගැල්වනයිස් බට පතිතවන ස්ථාන වල යකඩ වෙනුවට ලී භාවිතා කිරීම.

ii. යකඩ කප්පි වෙනුවට නයිලෝන් වලින් සාදන ලද කප්පි භාවිත කිරීම.

iii. යකඩ බට පතිත වන බොහෝ ස්ථාන වල ජල තටාක භාවිත කිරීම.

iv. කර්මාන්ත ගොඩනැගිල්ලේ බිත්තිය හා වහල අතර ඇති සිදුරුද මිලේනියම්සිටි නිවාස යෝජනා ක්‍රමයේ 05 කළාපය පිහිටි දිශාවට ඇති බිත්තියේ තිබූ අනෙකුත් සිදුරුද ගඩොල් භාවිතාකර ස්ථිරව ආවරණය කිරීම.

v. කර්මාන්ත ශාලාවේ 05 කළාපයට විවෘතව තිබූ ජනෙල්ද ස්ථිරව වසා දැමීම.

vi. කර්මාන්ත ශාලාවේ දොරවල් නිරන්තරයෙන් වසා තිබීම හා දොරවල් සඳහා ශබ්ද පැතිරීම අවම වන ලෙස ශබ්ද අවශෝෂණ ද්‍රව්‍ය යොදා තිබීම.

vii. කර්මාන්ත ශාලාවේ ශබ්දය ජනනය වන ස්ථාන වල ශබ්දය අවශෝෂක බාධක යොදා තිබීම.

viii. කර්මාන්ත ශාලාවේ වට තාප්පය තව දුරටත් උස්කර සෑදීම.

ix. නිසි පරිදි ගැල්වනයිස් බට නිෂ්පාදනය කර තිබේදැයි යන්න පරීක්ෂා කිරීමට කරනු ලබන වායු පරීක්ෂාව සිදු කරන ක්‍රමය වෙනස් කර තිබීම නිසා කලින් ඇති වූ අධික ශබ්දය අවම කිරීමට කටයුතු කිරීම.

x. කර්මාන්ත ශාලාවේ කලාප 05 පෙදෙසට ඇති බිත්ති සම්පූර්ණයෙන් ආවරණය කර ඇති නිසා සේවකයන්ට ඇතිවන අධික තාපය අවම කිරීම සඳහා කර්මාන්ත ශාලාවේ ඉදිරිපස බිත්ති විවෘත කිරීම.

xi. වානේ කම්බි නිෂ්පාදන ක්‍රියාවලියේදී ඇතිවන දුම චිමිනිය වෙත යොමු කිරීමට ක්‍රියාකර තිබීම.

එසේ වුවද නිවාස යෝජනා ක්‍රමයේ අංක 5 කලාපයේ ඉදිකර තිබූ තෙමහල් නිවාසයේ සිට නිරීක්ෂණය කළ විට ගැල්වනයිස් බට නිෂ්පාදන අංශයෙන් නිකුත්වන දුම හා ශබ්දය ප්‍රදේශය පුරා පැතිරයන තත්ත්වයක් නිරීක්ෂණය විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

(ආ) ඒ අනුව කර්මාන්තශාලාව නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව එදිනම අසල නිවාස යෝජනා ක්‍රමයේ අංක 05 කලාපය වෙත ගොස් මෙම තත්ත්වය නිරීක්ෂණය කර ඇත. අනතුරුව මෙම කර්මාන්ත ශාලාවේ ගැල්වනයිස් බට නිෂ්පාදන අංශයේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමේදී ඔවුන් විසින් සිදුකල පැහැදිලි කිරීම් වලට අනුව කර්මාන්ත ශාලාවෙන් පිටවන දුම්වල බලපෑම තව දුරටත් අඩු කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යෝජිත බව පවසන ලදි. මේ සම්බන්ධ අනෙකුත් නිරීක්ෂණ පහත පරිදි විය.

i. වානේ කම්බි නිෂ්පාදනයේදී ජනනය වන දුම මීටර් 77ක් පමණ උස චිම්නියකට යොමු කර ඒ තුළින් මුදා හැරීමට කටයුතු කර තිබුණි.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

ii. නමුත් අළුතින් ආරම්භ කරන ලද ගැල්වනයිස් කර්මාන්තයෙන් විමෝචනය වන දුම සම්පූර්ණයෙන්ම පාලනය කිරීම සඳහා විගණිත දින වන 2015 අගෝස්තු 23 දක්වාද කටයුතු කර නොතිබුණි.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි

<u>ගැල්වනයිස් කර්මාන්තයෙන් විමෝචනය වන දුම පාලනය කිරීම පිළිබඳ පහත සඳහන් අදහස් ඉදිරිපත් කරනු ලැබේ.</u>

ගැල්වනයිස් කර්මාන්තයෙන් විමෝචනය වන දුම පාලනය කිරිම සඳහා කර්මාන්තය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණි.

- ජනනය කරනු ලබන දූමාරය තෙත ස්ක්‍රබ්ස් තුනක් හරහා යැවීමට කටයුතු කිරීම
- සින්ක් බාත් එකට ආකලන ද්‍රව්‍යක් එකතු කිරීමත්
- සමස්ථ ක්‍රියාවලියම නැවත සකස් කිරීම "

iii. කාර්මික තාක්ෂණික ආයතනය මඟින් මෙම ආයතනයේ වායු පූරණ පද්ධති වල වැඩි දියුණු කිරීම් වලට අදාල සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 මාර්තු 12 දින සිට මාස 06ක කාලයක් ලබා ගෙන තිබූ නමුත් 2015 අවසන් වන විටත් කාර්මික තාක්ෂණික ආයතන මඟින් ඉහත ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් ඉදිරිපත් කර නොතිබුණි.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

iv. මෙම දුම සම්බන්ධව අදාල පැමිණිලිකාර ගෘහය ආශ්‍රිතව සිට නිරීක්ෂණය කළ විට වායු ගෝලයේ ඉතා පහත් ස්ථරයක මෙම දුම පැතිර යනු නිරීක්ෂණය විය. සාපේක්ෂ වශයෙන් ගත් විට නිවාස ව්‍යාපෘතිය වටා එම නිවාස වල වහල මට්ටමින් ඒවා පැතිර යනු දක්නට ලැබුණි.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

(ඇ) ඉහත නිරීක්ෂණයන්ට අමතරව 2014 ජුලි 24, 2014 ඔක්තෝබර් 24 හා 2015 අගෝස්තු 25 යන දිනවල මධ්‍යම පරිසර අධිකාරීයේ නිලධාරීන් ද සමඟ අප විසින් මෙම කර්මාන්ත පරිශ්‍රය තුලින් පිටවන ශබ්දය අධික වශයෙන් බලපාන බවට කියැවෙන අංක 05 කලාපයේ නිවාස රාත්‍රිකාලයේදි ද නිරීක්ෂණයට ලක්කළ අතර එහිදි අනාවරණය වු කරුණු පහත පරිදි විය.

i. මෙම නිරීක්ෂණයට අදාලව ලබාගත් දත්ත හා තොරතුරු අනුව කර්මාන්ත ශාලාව උපරිම ධාරිතාවයෙන් ක්‍රියාවට නැංවූ විට පිටවන ශබ්දය, අදාල නිවාස යෝජනා

ක්‍රමයේ සිට ලබාගත් විට අදාල ශබ්දයේ බළපෑම අනුමත පරාසය තුළ ඇති බව මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් විසින් නිරීක්ෂණය කෙරුණි.

ii. නිවාස යෝජනා ක්‍රමයේ අංක 05 කලාපයේ ඉදිකර තිබූ මහල් තුනකින් යුත් නිවාසයේ සිට මේ පිළිබඳ නිරීක්ෂණය කළ විට කර්මාන්ත ශාලාවෙන් නිකුත්වන ශබ්දයේ බලපෑම වැඩි බව නිරීක්ෂණය විය.

මේ අනුව නිවාස යෝජනා ක්‍රමයේ නිවාසවල තට්ටු සංඛ්‍යාව වැඩිවනවිට එහි බලපෑම වැඩිවන බව නිගමනය කළහැකි විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

**3.3 නිවාස ව්‍යාපෘතියේ නිවාසවල වෙනස්කම් සඳහා අවසර ලබා ගැනීම**

නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී කර්මාන්ත ශාලාවේ රක්ෂිත ප්‍රදේශ ඒ සඳහා යොදාගෙන තිබූ නමුත් එම ප්‍රදේශ වල නිවාස ඉදිකිරීමේදී කර්මාන්ත ශාලාවේ බලපෑම අවම වන ලෙස නිවාස සැලසුම් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව මෙම කලාපයේ නිවාසවල සිදු කරන ලද වෙනස්කම් වලට අදාලව නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.

(අ) ඉහත සඳහන් කළ පරිදි කර්මාන්ත රක්ෂිතයට යාබද රක්ෂිත ප්‍රදේශයද ඇතුළත්ව මෙම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා තිබූ අතර එහිදී කර්මාන්ත ශාලාවේ සීමා මායිම් ආසන්නයේ තනි තට්ටුවේ නිවාස පමණක් ඉදිකිරීම අනුමත කර තිබුණි. නිවාස සම්බන්ධව කරනු ලබන වෙනස් කිරීම් වලදීද මෙම කොන්දේසිය මත අදාල නිවාස සැලසුම් අනුමත කළයුතු විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

**කඩුවෙල මහා නගර සභාවේ අදහස් දැක්වීම**
පිළිතුරු ලබා දී නොමැත.

(ආ) එසේ තිබියදී මෙම නිවාස සංකීර්ණයේ විශේෂයෙන් කර්මාන්ත ශාලාවේ බලපෑම වැඩි වශයෙන් ඇති අංක 05 කලාපයේ නිවාස විවිධ වෙනස්කම් වලට භාජනය කර තිබුණි. විශේෂයෙන් කර්මාන්ත ශාලාවේ බළපෑම පිළිබඳ විරෝධතා වැඩි වශයෙන් එල්ලවන නිවැසියන්ගේ නිවාස පරීක්ෂාවට ලක් කිරීමේදී එහි එක් නිවසක් මහල් 03කින් යුතු නිවසක් වූ අතර එය කර්මාන්ත ශාලාව සමීපව පිහිටීම නිසා කර්මාන්ත ශාලාවෙන් ඇති කරන බළපෑම වැඩිවිය හැකි බවට නිරීක්ෂණය කළහැකි විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**
"එකඟයි"

**කඩුවෙල මහා නගර සභාවේ අදහස් දැක්වීම**
පිළිතුරු ලබා දී නොමැත.

(ඇ) ඉහත සඳහන් තනි තට්ටුවේ නිවාස ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමේදී අදාල ගොඩනැගිලි සැළසුම්, තෙමහල් ගොඩනැගිල්ලක් ලෙස එවකට කඩුවෙල ප්‍රාදේශීය සභාව විසින් අනුමත

කිරීමෙන් පසුව එසේ ඉදිකිරීම් කර තිබුණි. මේ අනුව මෙම තෙමහල් ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී කඩුවෙල නගර සභාව විසින් නිවාස ව්‍යාපෘතිය ආරම්භයේදී පැවතිය යුතු කොන්දේසි සීමාවන් සැලකිල්ලට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එසේම ඉහත නිරීක්ෂණයට අනුව මෙම නිවාස ව්‍යාපෘතිය කර්මාන්ත ශාලාව ආසන්නයේම පිහිටුවා තිබීම නිසා මෙහි බලපෑම තවත් වැඩිවන බවද නිරීක්ෂණය විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**

"එසේ වුවත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් කඩුවෙල මහා නගර සභාවේ ගරු නගරාධිපතිතුමන්ගෙන් මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතියේ කළාප අංක 5 හි තෙමහල් නිවාස සඳහා ලබාදුන් අනුමැතිය/ සහතිකය තහවුරු කරන ලෙස විමසන ලද 2014.12.16 සහ 2014.04.11 දිනැති ලිපි සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නොමැත."

**කඩුවෙල මහා නගර සභාවේ අදහස් දැක්වීම**

පිළිතුරු ලබා දී නොමැත.

### 3.4 කර්මාන්තය නිසා ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළු

කර්මාන්ත ශාලාව සම්බන්ධව අදාල නිවැසියන් විසින් පෙන්වාදී ඇති අනෙක් කරුණ ලෙස දන්වා ඇත්තේ කර්මාන්ත ශාලාව මගින් සිදුවන වායු දූෂණය හේතුවෙන් නිවාස යෝජනා ක්‍රමය තුල ජීවත්වන නිවැසියන්ට විවිධ ලෙඩ රෝග ඇති වී ඇති බවයි. මේ සම්බන්ධව කඩුවෙල නගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය ඒකකයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගෙන් ඊට අදාලව පැහැදිලි කිරීම් ලිඛිතව ලබාගන්නා ලද අතර එහිදි අදාල නිලධාරීයා විසින් වාර්තා කර ඇති පරිදි එවැනි ලෙඩ රෝග හා සෞඛ්‍යමය ගැටළු කිසිවක් මෙම නිවාස යෝජනා ක්‍රමය තුල ජීවත්වන නිවැසියන් සම්බන්ධයෙන් වාර්තා වී හෝ අනාවරණය කරගෙන නොමැති බව දක්වා ඇත.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදහස් දැක්වීම**

"එකඟයි"

**කඩුවෙල මහා නගර සභාවේ අදහස් දැක්වීම**

පිළිතුරු ලබා දී නොමැත.

## 4. නිගමනය

දිගින් දිගටම අයිතිය වෙනස් වෙමින් තිබියදී දේශීය ආයෝජකයෙක් විසින් ආරම්භ කරනු ලැබූ මෙම කර්මාන්ත ශාලාව අනාගතයේදී තවත් පුළුල් විය හැකි අතර වර්තමානයේදී පැන නැගුණු එම පාරිසරික ගැටළු අවම කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ උපදෙස් මත එහි කළමනාකාරීත්වය විවිධ පියවර ගෙන තිබුණද දිගින් දිගටම යාබද නිවැසියන්ගෙන් කර්මාන්ත ශාලාව වෙත විරෝධයන් එල්ල වෙමින් පැවතුණි.

මෙම කරුණු සැලකිල්ලට ගෙන මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා ගත් දත්ත හා තොරතුරු අනුව කළාප අංක 05 හි පිහිටි උස ගොඩනැගිලිවල සිට අදාල පරීක්ෂණයන් සිදු කිරීමේදී දෙමහල් හෝ ඊට වැඩි, මහල් වලින් යුතු ගොඩනැගිලි වලදී මෙම පාරිසරික බලපෑම ඇති කරන පරාසයට ආසන්නයේ පැවති බව වාර්තා කර ඇත.

ඒ අනුව පහත සඳහන් තත්ත්වයන් තුල මෙහි බලපෑම තවදුරටත් වැඩි විය හැකි බව නිරීක්ෂණය විය.

i. කර්මාන්තශාලා ධාරිතාවය පවතින මට්ටමට වඩා වැඩි කර ගැනීමට ක්‍රියා කිරීමේදී
ii. කර්මාන්තශාලාව අවට නිර්දේශ උසට වඩා වැඩි උසකින් යුතු නිවාස තැනීමේදී

තවද කඩුවෙල මහා නගර සභාව විසින් මෙහි නිවාසවල සිදු කෙරෙන වෙනස්කිරීම් වලට අදාල වූ නිවාස සැලසුම් අනුමත කිරීම නිසි අවධානයකින් තොරව සිදුකර තිබීම නිසා අනුමත ප්‍රමාණය ඉක්ම වූ මහල් සංඛ්‍යාවක් සහිත ඉදිකිරීම් සිදු කිරීමට හැකියාව ලැබී තිබූ අතර මෙම අඩුපාඩුවද මෙම ගැටළුකාරී තත්ත්වය තවදුරටත් වැඩි කිරීමට හේතු වී තිබුණි.

මෙම කර්මාන්ත ශාලාව 1961 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, මෙම ගැටළුව පැන නැගීමට හේතු වූ නව ගැල්වනයිස් නිෂ්පාදන අංශය ආරම්භ කර තිබුණේ 2012 වර්ෂයේදීය. තවද නිවාස යෝජනා ක්‍රමය අනුමත කරන අවස්ථාවේදී නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නිරීක්ෂණ වැඩ කමිටු වාර්තාවට අනුව ලංකා වානේ සංස්ථාවේ අනාගත වැඩිදියුණු කිරීම්වලදී මෙම නිවාස ව්‍යාපෘතිය ගැටළුවක් විය හැකි බවට නිරීක්ෂණ ඉදිරිපත්කර තිබුණි. එනමුත් ගැල්වනයිස් නිෂ්පාදන අංශය ආරම්භයේදී එම ව්‍යාපෘතිය අනුමත කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය ආයතන විසින් ඊට අදාල කොන්දේසි, මඟපෙන්වීම් හෝ නිර්දේශ කිසිවක් ලබා දීමට කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය.

ඒ අනුව මෙම ගැටළුව සඳහා මූලිකවම මැදිහත් විය යුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පරිසර අංශය විසින්ද මෙවැනි ව්‍යාපෘති ආරම්භයේදී ඇතිවිය හැකි පාරිසරික ගැටලු පිළිබඳ ප්‍රමාණවත් අවධානය යොමුකළ යුතු වේ. තවද මධ්‍යම පරිසර අධිකාරිය විසින් එහි පාරිසරික කරුණු ගැඹුරින් අධ්‍යනය කල යුතු අතර එහිදී මෙවැනි රක්ෂිතයන් ඇතිකර තිබ්මේ මූලික පරමාර්ථය පිළිබඳ අවධානයෙන් කටයුතු කල යුතුව තිබූ අතර අදාල පළාත් පාලන ආයතනය විසින් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී නිවාස ව්‍යාපෘති ආරම්භයේදී පැවැති කොන්දේසි හා සීමාවන් පිළිබඳ සැලකිලිමත් විය යුතු විය. ගොඩනැගිලි පිළිබඳ එම කොන්දේසි පිළිපැදීම හා ඇති වී ඇති පාරිසරික ගැටළු පිළිබඳව කර්මාන්ත ශාලාවේ සිදු කළ යුතු වෙනස්කම් අවශ්‍ය පරිදි කඩිනමින් ඉටුකිරීම මෙහිදී මූලික අවශ්‍යතාවයකි.